## 'Atlas World' සාමාජිකත්වය සඳහා කොන්දේසි සහ නියාමයන්:

'Atlas World' වෙත ඔබව සාදරයෙන් පිළිගනිමු. ඔබේ දරුවන්ගේ අධ්‍යාපනික ප්‍රගතිය ඉහළ නැංවීම සඳහා නිර්මාණය කර ඇති අපගේ පාරිභෝගික සේවා වැඩසටහනේ (CRM) සාමාජිකත්වය දැරීමට ඔබ ගත් පියවර අපි අගය කොට සලකමු. මෙම 'Atlas World' සාමාජිකත්වය' ලබා ගැනීමය සඳහා ලියාපදිංචි වීමට ප්‍රථම අප ඔබට මෙහි අඩංගු කොන්දේසි සහ නියාමයන් පැහැදිලිව කියවා අවබෝධ කරගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු. 'Atlas World' සඳහා ලියාපදිංචි වීමෙන්, ඔබ මෙම නියමයන් සහ කොන්දේසි වලට එකග වන බවට පැහැදිලි පිළිගැනීමක් ලෙස සලකනු ලැබේ.

1. 'Atlas World' වැඩසටහනේ අයිතිය.

අ. 'Atlas World' සන්නාමය සමග වැඩ සටහන් පිළිබඳ පූර්ණ අයිතිය Atlas Axillia Company (Pvt) Ltd. සමාගම සතු වේ. මෙතැන් පටන් **'සමාගම'** ලෙස හඳුන්වනු ලැබේ. 'Atlas World Loyalty වැඩසටහනට සහභාගී වීමෙන්, ඔබ වැඩසටහනේ සියලුම අංග, නිර්මාණයන්, නීතිරීති, ප්‍රතිලාභ, ත්‍යාග, සහ ඊට සම්බන්ධිත ඕනෑම බුද්ධිමය දේපල ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී, ඇට්ලස් ඇක්සීලියා පුද්ගලික සමාගම සමාගම සතු දේපළ බව පිළිගෙන එකඟ වේ.

ආ. සමාගමේ ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව 'Atlas World' වැඩසටහන, එහි අඩක් හෝ කොටස් අනවසරයෙන් භාවිතා කිරීම, ප්‍රතිනිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හෝ වෙනස් කිරීම තහනම් වන අතර එවැනි ක්‍රියාවන් නීතිමය ක්‍රියාමාර්ගවලට තුඩු දිය හැකිය.

ඇ. 'Atlas World' වැඩසටහන් වලට ඔබ සහභාගී වීමෙන් ඔබට එම වැඩ සටහන් පිළිබඳ කිසිම නෛතික අයිතියක් හිමි නොවේ. එම වැඩසටහන් වල අයිතිය Atlas Axillia Company (Pvt) Ltd. සමාගම සතු බව ඔබ පිළිගනියි. 'Atlas World' වැඩසටහන තම අභිමතය පරිදි, දැනුම්දීමකින් හෝ නොමැතිව වෙනස් කිරීමට, සංසෝධනය කිරීමට, අත්හිටුවීමට හෝ අවසන් කිරීමට සමාගමට අයිතිය ඇති අතර, එවැනි වෙනස්කම් සඳහා කිසිදු සාමාජිකයෙකුට හෝ තෙවන පාර්ශවයකට වගකියනු නොලැබේ

ඇ. 'Atlas World' වැඩසටහනට සම්බන්ද වීමෙන් පසුව සමාගම සඳහන් කල නියාමයන් සහ කොන්දේසි සියල්ලටම ඔබ අනුගත වීමට ඔබ එකඟ වන අතර, මෙම වැඩසටහනේ පූර්ණ අයිතිය Atlas Axillia Company (Pvt) Ltd. සමාගම සතුවන බව ඔබ පිළිගනු ඇත.

ඉ. ඔබට මෙම 'Atlas World' වැඩසටහනේ හිමිකාරිත්වය පිළිබඳව යම් ගැටළුවක් හෝ පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් මෙහි සපයා ඇති තොරතුරු විමසීමෙ අංකය හෝ වැඩසටහන් ක්ෂණික ඇමතුම් අංකය 0772 111 333 අමතා විස්තර ලබා ගත හැක.

ඊ. මෙම වගන්තිය මෙහි දක්වා ඇති අනිකුත් කොන්දේසි සහ නියාමයන් වලට යටත්වේ. මෙම වැඩසටහනට සම්බන්ද වීමෙන් පසු ඔබ සියලුම කොන්දේසිවලටත්, මෙහි අඩංගු වැඩසටහන් අයිතිය පිළිබඳ කොන්දේසියටත් එකග වනු ඇත.

2. සාමාජිකත්වය දැරීමට සුදුසුකම්.

අ. 'Atlas World' සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමට, ඔබ වයස අවුරුදු 18 හෝ ඊට අඩු දරුවෙකුගේ මාපියෙකු හෝ නීත්‍යානුකූල භාරකරුවෙකු විය යුතුය.

ආ. ලියාපදිංචි ක්‍රියාවලියේදී ඔබ නිවැරදි සහ දැනට පවත්නා තොරතුරු සැපයිය යුතුය

3. ගිණුම් රහස්‍ය තොරතුරු:

අ. සාමජික අංක, ගිණුමට පිවිසෙන රහස්‍ය අංක ඇතුළුව ඔබේ රහස්‍ය තොරතුරුවල රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා ඔබ වගකිව යුතුය.

ආ. ඔබගේ ගිණුමට අනවසර ප්‍රවේශයක්, ඔබේ රහස්‍ය තොරතුරු අවභාවිතාවක් හෝ වෙනත් ආරක්ෂක උල්ලංඝණයක් පිළිබඳව ඔබ වහාම 'Atlas World' වෙත දැනුම් දිය යුතුය.

4. දෙමාපියන් අනුමැතිය:

අ. 'Atlas World' සඳහා ලියාපදිංචි වීමෙන්, ඔබ ඔබේ දරුවාගේ සහභාගීත්වය සඳහා අවශ්‍ය දෙමාපිය අනුමතිය ලබාගෙන ඇති බව තහවුරු කරයි.

ආ. 'Atlas World' ඔබේ දරුවාගේ අධ්‍යාපනික ප්‍රගතියට අදාළ පුද්ගලික තොරතුරු රැස් කර තබා ගන්නා බවත් එය ශ්‍රී ලංකාවේ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූලව බවත් ඔබ තේරුම් ගෙන ඇත.

5. සාමාජිකයින් සඳහා ප්‍රතිලාභ:

අ. 'Atlas World' සාමාජිකයෙක් ලෙස ඔබට අධ්‍යාපනික වටිනාකමකින්යුත් සම්පත් පරිශීලනය කිරීමටත්, පිවිසීමටත්, විශේෂ වට්ටම් සමග විශේෂිත පුවත් ලබා ගැනීමට සුදුසුකම් ලබනු ඇත.

ආ. සාමාජිකයින්ට නිර්දේශිත ප්‍රතිලාභ වරින් වර Atlas Axillia Company (Pvt) Ltd. සමාගම විසින් සංසෝධනය කරනු ඇත.

6. තහනම් ක්‍රියාකාරකම්:

අ. 'Atlas World' වැඩසටහන් නීති විරෝධී ක්‍රියාකාරකම් සඳහාද අපේ ප්‍රතිපත්ති වලට පටහැනිව ක්‍රියා කිරීම සපුරා තහනම් වේ.

ආ. අවභාවිතා කිරීම, 'Atlas World' වැඩසටහනට හානි පැමිණවීම, සාමාජිකයන් අසීරුවට පත් කිරීම හෝ හානියක් කිරීමට උත්සාහ කිරීම ඔබේ සාමාජිකත්වය වහාම අහෝසි කිරීමට හේතු වනු ඇත.

7. අන්තර්ග භාවිතය:

අ. 'Atlas World' වැඩසටහන් හරහා සියලුම තොරතුරු අන්තර්ගතයන් පුද්ගලික භාවිතය සඳහා පමණක් වන අතර, වාණිජ වෙළඳ කටයුතු සඳහා භාවිතා කිරීම සපුරා තහනම් වේ. සියලුම අන්තර්ගතයන් බුද්ධිමය දේපල පනත යටතේ ආරක්ෂා කර ඇත.

ආ. Atlas Axillia Company (Pvt) Ltd. සමාගමේ ලිඛිත අවසරයකින් තොරව අඩංගු කරුණු බෙදාහැරීම, වෙනස් කිරීම, නැවත පිටපත් කිරීම හෝ අවභාවිතය සපුරා තහනම් වේ.

8. නිවැරදි තොරතුරු භාවිතය.

අ. **අක්‍රීය දත්ත**: 'Atlas World' වැඩසටහනේ සන්දර්භය තුළ අක්‍රිය දත්ත යනු පරිශීලකයා හෝ සමාගම විසින් අවසාන අන්තර්ක්‍රියාව හෝ යාවත්කාලීන කිරීම සිට මාස 12 ඉක්මවන කාල සීමාව තුළ භාවිතා නොකරනලද, වෙනස් කර හෝ වෙනත් ආකාරයකින් අන්තර්ක්‍රියා කර නොමැති පාරිභෝගික සම්බන්ධ තොරතුරු, වාර්තා හෝ දත්ත ඇතුළත් වේ.

ආ. **අක්‍රිය දත්ත සංරක්ෂණය කිරීම**: 'Atlas World' අක්‍රිය දත්ත ආරක්ෂිතව ආචයනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා දත්ත සංරක්ෂණ ක්‍රියාවලියක් පවත්වාගෙන යා යුතු අතර එම සංරක්ෂණ ක්‍රියාවලියට පහත ප්‍රධාන අංග ඇතුළත් විය යුතුය:

i. **හඳුනා ගැනීම සහ වර්ගීකරණය**: අනන්‍යතා මත පදනම් වූ දත්ත හරහා යවන ඕනෑම සන්නිවේදනයකට ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වන සාමාජිකයින් හෝ බෙදා හැරීමට නොහැකි වීම හේතුවෙන් ආපසු හැරෙන සන්නිවේදන මත පදනම්ව අක්‍රීය දත්ත වරින් වර හඳුනා ගනු ලැබේ. පූර්ව නිශ්චිත නිර්ණායක මත අක්‍රීය දත්ත වර්ගීකරණය සහ ලේඛනගත කිරීම තීරණය කරනු ලැබේ. සැක සහ අපැහැදිලි බව මගහරවා ගැනීම සඳහා, අක්‍රීය කෙරෙන දත්ත වර්ගීකරණය අනන්‍යතා මත පදනම් වූ ජංගම දුරකථන අංකය, විද්‍යුත් තැපැල, සාමාජික නම වැනි දත්ත ක්ෂේත්‍රවලින් නියෝජනය වේ. කෙසේ වෙතත් 'Atlas World' විසින් විදසුන් ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන ජනවිකාස දත්ත තබා ගනු ලැබේ.

ii. **ආරක්ෂිත දත්ත ආචයනය**: සංරක්ෂණය කිරීම සඳහා තෝරාගත් අක්‍රීය දත්ත, අදාළ දත්ත ආරක්ෂණ සහ රහස්‍යතා රෙගුලාසිවලට අනුකූලව ආරක්ෂිතව ආචයනය කළ යුතුය. 'Atlas World' මෙම දත්ත, අනවසර ප්‍රවේශ වීම්, නැතිවීම් හෝ හානිවලින් ආරක්ෂා කිරීම සඳහා පවතින නීතියට අනුකූලව ආරක්ෂක පියවරයන් ගනු ලැබේ.

iii. **දත්ත රඳවා තබා ගැනීම**: 'Atlas World' විසින් අක්‍රීය දත්ත සංරක්ෂණය කෙරෙන නිශ්චිත කාලසීමාව දක්වා ඇති දත්ත රඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් ස්ථාපනය කළයුතු අතර එම ප්‍රතිපත්ති පිළිපැදිය යුතුය. මෙම ප්‍රතිපත්ති සඳහා නියාමන අවශ්‍යතා සහ කර්මාන්තයේ හොඳම භාවිතයන් සැලකිල්ලට ගනී.

iv. **ප්‍රවේශ පාලනය**: සංරක්ෂිත අක්‍රීය දත්ත වෙත ප්‍රවේශය බලයලත් පුද්ගලයන්ට පමණක් සීමා කර ඇති අතර අනවසර ප්‍රවේශයන් වැලැක්වීම සඳහා දැඩි ප්‍රවේශ පාලන සහ පරිශීලක සත්‍යාපන ක්‍රමයන් ක්‍රියාත්මක වේ.

v. **දත්ත ප්‍රතිසාධනය**: නීත්‍යානුකූල ව්‍යාපාර, නෛතික හෝ නියාමන අරමුණු සඳහා සංරක්ෂිත දත්ත අවශ්‍ය වන අවස්ථාවන්හිදී, 'Atlas World' විසින් එම දත්ත කාලානුරූපව ලබා ගැනීම සහ ප්‍රතිසාධනය සඳහා ක්‍රියාපටිපාටි ස්ථාපිනය කර ඇත.

ඇ. **විගණනය සහ අනුකූලතාව**: 'Atlas World' මෙම දත්ත සංරක්ෂණ වගන්තිය පිළිපැදීම සහතික කිරීම සඳහා වරින් වර විගණන සිදු කරනු ඇත. මෙම විගණනවලට සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලිය, ප්‍රවේශ පාලනය සහ දත්ත ආචයනය පිළිබඳ සමාලෝචනයක් ඇතුළත් වේ. එයින් හඳුනාගත් ඕනෑම අනනුරූපතාවයක් කඩිනමින් විසඳීමට පියවර ගනු ලැබේ.

ඈ. **අක්‍රීය දත්ත බැහැර කිරීම**: නිර්වචනය කරන ලද රඳවා ගැනීමේ කාලසීමාව අවසන් වූ පසු, 'Atlas World' දත්ත රඳවා ගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලව අක්‍රීය දත්ත ආරක්ෂිතව බැහැර කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කෙරේ. දත්ත ආපසු ලබා ගැනීමේ හැකියාවක් නොමැති බව සහතික කරන ආකාරයෙන් බැහැර කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබේ.

ඉ. **වගකීම**: 'Atlas World' පාර්ශවයෙන්ගේ දැඩි නොසැලකිලිමත්කම හෝ හිතාමතාම විෂමාචාරය හැරුණු විට, මෙම වගන්තියට අනුකූලව සංරක්ෂණය කර ඇති අක්‍රීය දත්තවල අලාභයක් හෝ හානියක් සඳහා 'Atlas World' වගකියනු නොලැබේ.

සැකය සහ අපැහැදිලි බව මඟහරවා ගැනීම සඳහා **"නොසැලකිලිමත්කම"** යන්නෙන් අදහස් වන්නේ දත්ත පරිශීලනය කිරීමේදි එම දත්ත සුරැකීමට, නිසි සැලකිල්ලක් දැක්වීමට හෝ අවශ්‍ය පූර්වාරක්ෂාවන්/ආරක්ෂිත පියවරවල් ගැනීමට අපොහොසත් වීමයි. නොදැනුවත්වම සිදුවන වැරදි, දෝෂ, සාමාන්‍ය වැරදි සහ අධීක්ෂණ තුලින් දත්ත උල්ලංඝනයවීම හෝ ආරක්ෂිත අතපසුවීම්ද ඇතුලත්වේ. මෙයින් අදහස් කරනු ලබන්නේ ආයතනය යහපත් ක්‍රියා

පිළිවෙත් අනුගමනය නොකිරීම, ආරක්ෂිත ක්‍රමවේද මගහැරීම, එතුලින් දත්ත රහස්‍යභාවය, අඛණ්ඩතාවය හෝ උපයෝජ්‍යතාව උල්ලංඝණය වීමය.

"**හිතාමතා විෂමාචාරය**" යන්නෙන් අදහස් වන්නේ හිතාමතා, චේතනාන්විතව දත්ත සහ ආරක්ෂිත පද්ධතියට හානි පමුණුවන ක්‍රියාකාරකම්වල යෙදීමය. එයට දත්ත විකෘති කිරීම, දත්ත සොරකම් කිරීම, අනවසර අනුගතවීම, චේතාන්විත හානිකිරීම් සහ සංරක්ෂිත ක්‍රියාවලියේදී තොරතුරු සහ දත්ත වලට හිතාමතාම හානි කිරීම වැනි ද්වේෂසහගත චේතනාවෙන් සිදු කරන ක්‍රියාවන් ඇතුළත් වේ. 'Atlas World' විසින් හිතාමතා විෂමාචාරය, දත්ත සහ ආරක්ෂක පිළිවෙත් අනුගමනය නොකිරීම විශ්වාසය උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලබන අතර එය සාපරාධී වරදක් ලෙස සැලකිය හැකිය.

ඊ. **අක්‍රීය දත්ත සඳහා සාමාජිකයෙකුගේ අයිතිවාසිකම්**: වැඩසටහන මගින් " අක්‍රීය" ලෙස හඳුනාගෙන වර්ගීකරණය කිරීමෙන් පසුව 'Atlas World' සාමාජිකයෙකුට 'Atlas World' වැඩසටහනට ප්‍රවේශ වීමට ඇති අයිතිය, එහි ප්‍රතිලාභ හෝ අනුගත වීමට ඇති හිමිකම්, ප්‍රවේශ වීමට, මකාදැමීමට, සේවා හරහා දත්ත භාවිතයට, නිවැරදි කිරීමට, සීමා කිරීම්කට, ඔහුගේ/ඇයගේ දත්ත සංරක්ෂණය කිරීමට විරෝධය දැක්වීමට ඇති අයිතිය අහිමි වූ බව සලකනු ලැබේ.

උ. **දත්ත සංරක්ෂණය සඳහා සංශෝධන:** නීතිමය අවශ්‍යතා, නව කර්මාන්ත ප්‍රමිතීන් හෝ නියමිත පිළිවෙත් හෝ අවශ්‍යතාවයන්ගේ වෙනස්කම්වලට අනුකූලවීමට අවශ්‍ය පරිදි මෙම දත්ත සංරක්ෂණ වගන්තිය යාවත්කාලීන කිරීමට හෝ වෙනස් කිරීමට 'Atlas World' හට පූර්ණ අයිතිය ඇති අතර මෙහි ඇති ඕනෑම වගන්තියක ඇති යම් ප්‍රමාණාත්මක වෙනසක් පිළිබඳව 'Atlas World' සාමාජිකයින්ට නිසි දැනුවත් කිරීමක් කරනු ලැබේ.

ඌ. 'Atlas World' සාමාජිකත්වය සඳහා ලියාපදිංචි වීමෙන්, ලියාපදිංචි වීමේ ක්‍රියාවලියේදී ඔබ විසින් සපයන ලද සියලුම තොරතුරු හෝ පසුකාලීන යාවත්කාලීන කිරීමේදී සපයන ලද තොරතුරු, අපගේ අධ්‍යාපනික වැඩසටහන් ආශ්‍රිත අන්තර්ගතය, ප්‍රවර්ධනයන්, ප්‍රචාරණයන් ඇතුළු සන්නිවේදනයන් සඳහා භාවිතා කරන බවට ඔබ මෙයින් එකඟ වේ. මෙයට විද්‍යුත් ලිපි, කෙටි පණිවිඩ (SMS), අලෙවිකරණ ද්‍රව්‍ය සහ ඉලක්කගත වෙළඳ දැන්වීම් ඇතුළත් නමුත් ඒවාට සීමා නොවේ.

එ. පාරිභෝගික සටහන්, පුද්ගලික තොරතුරු, නම්, දුරකථන අංක, මනාපයන් සහ මිලීදී ගැනීම් රටා ඉහත සඳහන් තොරතුරු සඳහා භාවිතා කෙරේ. කෙසේ වෙතත් වැඩසටහනට අනුව තොරතුරු ආරක්ෂා කරන පිළිවෙත් පවතින නීතියට අනුකූලව සිදු කරනු ලැබේ.

ඒ. පාරිභෝගිකයන්ට ඉහත සඳහන් තොරතුරු ලබා ගැනීම හෝ ප්‍රතික්කෂේප කිරීමට අවස්ථාව ඇත. පාරිභෝගිකයන්හට තම තොරතුරු සංශෝධනය කිරීමට හැකිවන අතරම ඒ පිළිබඳව වැඩසටහන් ප්‍රවර්ධන නිලධාරීන්ව කෙලින්ම ඇමතිය හැක.

ඔ. 'Atlas World' වැඩසටහනට ලියාපදිංචි වීමේදී පාරිභෝගිකයා එහි අඩංගු නිර්නායකයන්, කොන්දේසි කියවා, වගන්ති තේරුම් ගෙන, පිළි අරගෙන ඔවුන්ගේ තොරතුරු වැඩ සටහනට අදාල ප්‍රවර්ධනයන් සඳහාද වාචික අදහස් සඳහාද සන්නාම ප්‍රවර්ධනයන් සඳහාද අධ්‍යාපනික වටිනාකමකින්යුත් වැඩසටහන් සඳහාද Atlas Axillia Company (Pvt) Ltd. සමාගම උපයෝගී කරගනු ඇත.

9. සාමාජිකත්වය අහෝසි කිරීම:

අ. Atlas Axillia Company (Pvt) Ltd. සමාගම ඔබගේ සාමාජිකත්වය අත්හිටුවීමට හෝ අහෝසි කරනු ලබන්නේ ඔබ විසින් පිළිගත් කොන්දේසි වලට පටහැනිව ක්‍රියා කලොත් සහ උල්ලංඝනය කිරීමෙන් අනතුරුවයි.

ආ. ඔබට 'Atlas World' පාරිභෝගික සහාය අංශයට දැනුම් දීමෙන් ඔබේ සාමාජිකත්වය අහෝසි කර ගැනීමට හැකියාව ඇත.

10. වගකීම සහ වන්දි ගෙවීම:

අ. 'Atlas World' වැඩසටහන ඔබ විසින් භාවිතා කිරීමේදී ඍජුව හෝ වක්‍රව ඇතිවූ හානි සඳහා Atlas Axillia Company (Pvt) Ltd. සමාගම වග කියනු නොලැබේ.

ආ. ඔබගේ ක්‍රියාවන් නිසා ඇති හෝ ඔබ විසින් පලකළ අන්තර්ගතයෙන් හේතු කොට වන ඕනෑම හිමිකම්, පාඩු හෝ හානි Atlas Axillia Company (Pvt) Ltd. සමාගම නිදහස් කරනු ලබන බවට සහ නිදොස් කරනු ලබන බවට එකඟ වෙයි.

11. කොන්දේසි සංසෝධනය:

අ. සමාගම විසින් කලින් කලට කොන්දේසි සහ නියාමයන් සංසෝධනය කරනු ලැබේ. එම සංසෝධන ඔබට 'Atlas World' විද්‍යුත් ලිපිනය හරහා දැනුවත් කෙරේන අතර එම සංසෝධන Atlas Axillia Company (Pvt) Ltd. සමාගමේ වෙබ් අඩවියෙන් ද ලබා ගත හැක.

ආ. 'Atlas World' අඛණ්ඩව භාවිතා කිරීමෙන් සංසෝධිත කොන්දේසි සහ නියාමයන් ඔබ විසින් පිළිගනු ලබයි.

12 . පාලන නීතිය:

අ. මෙහි සඳහන් කල නීති නියාමයන් සහ කොන්දේසි අනුගත කර ඇත්තේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතීන්ට යටත්වය.

13. 'Atlas World' සාමාජිකත්වය සඳහා හුදෙක් මෙම කොන්දේසි සහ නියමයන්ට පමණක් යටත් වේ. මෙම කොන්දේසි සහ නියමයන් සිංහල භාෂාවටද පරිවර්තනය කරනු ලැබේ. එබැවින් මෙම කොන්දේසි සහ නියමයන්හි ඉංග්‍රීසි, සහ සිංහල පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුව හොත්, මෙම කොන්දේසි සහ නියමයන්හි ඉංග්‍රීසි පාඨය බලපැවැත්විය යුතු වේ.

තොරතුරු සහ ඇමතුම්:

ඔබට මෙම කොන්දේසි සහ නියාමයන් පිළිබඳව යම් ගැටලුවක් හෝ පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් අපේ වැඩසටහන් ක්ෂණික ඇමතුම් අංකය 0772 111 333 අමතන්න.

'I Agree' සංකේතය එබීමෙන් ඔබ ලියාපදිංචිවූ අවස්ථාවේදී සියලුම නියාමයන් කොන්දේසි කියවා බලා අවබෝධ කරගත් පසු පිළිගත් බවට Atlas Axillia Company (Pvt) Ltd. සමාගම විශ්වාස කරයි.

පාරිභෝගිකයන්ට ඉහත සඳහන් තොරතුරු ලබා ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමට

පාරිභෝගික සටහන්, පුද්ගලික සටහන්, තොරතුරු, නම්, දුරකථන අංක, මනාපයන් සහ මිලදී ගැනීම් රටා ඉහත සඳහන් තොරතුරු සඳහා භාවිතා කෙරේ. කෙසේ වෙතත් වැඩසටහනට අනුව තොරතුරු ආරක්ෂා කරන පිළිවෙත් පවතින නීතියට අනුකූලව සිදු කෙරේ.